# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1784/5 - 2012 නොවැම්බර් මස 12 වැනි සඳුදා - 2012.11.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩි පාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වන විරෝධතාවයන්, 2012 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක් ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
සභාපති,<br>
ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 16 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1945ක් වූ අගෝස්තු මස 10 වැනි දින අංක 9447 දරන *ගැසට් පත්‍රයෙහි* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කළින් කළ වෙනස් කරන ලද්දා වූ ද, අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ වෙනස් කරන ලද්දා වූ තීරණ එම උපලේඛනය සඳහා පහත I කොටස ඇතුළත් කිරීමෙන් ද, II කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතු ය.

1A - G 16872 - 345 (2012/11)

*I කොටස*

***සේවකයින්ගේ පන්තිය***

*නුපුහුණු කම්කරුවෝ :*

| | |
|---|---|
| සිවිල් ඉංජිනේරු<br>යාන්ත්‍රික ඉංජිනේරු<br>ගුවන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු | පුහුණුවක් අවශ්‍ය නොවන කම්කරුවන් |

*අර්ධ පුහුණු කම්කරුවෝ :*

*සිවිල් ඉංජිනේරු*

පින්තාරුකාරයෝ, අයින් කානු කැපීම, පාර මතුපිට සිරීම, කළුගල් ඇතිරීම, පැටවීම, බෑම සහ කළුගල් ගොඩගැසීම, පාරට තාර දැමීම සහ අතින් කොන්ක්‍රීට් ඇනීම යන වැඩවල යෙදී සිටින කම්කරුවන් ද ඇතුළත්ව මාර්ග අළුත්වැඩියා කිරීමෙහි, තැනීමෙහි සහ පවත්වාගෙන යෑමෙහි යෙදී සිටින මේසන් අත් උදව්කරුවෝ සහ කම්මල්කරු අත්උදව්කරුවෝ.

*යාන්ත්‍රික ඉංජිනේරු*

කුළුගෙඩිකාරයින් සහ මිටි යෙන් තලන්නෝ, පැට්ලර්වරු (යකඩ හා පිත්තල), උණු කරන්නෝ (යකඩ හා පිත්තල) පරීක්ෂකයෝ, (දැව) ඉරන්නෝ, කෝර්කාරයෝ, (ලී) බොයිලේර්වරු සේවකයෝ, ඩ්‍රයිවර්වරු, (ඇන්ජින්) ෆයර්මන්වරු, ටයර් රෙපෙයාර් කරන්නෝ, ටයර් වෝල්කනයිසින් කරන්නෝ, පින්තාරු කාරයෝ, ඇතිකාරයෝ, ග්‍රීස් ගසන්නෝ, සුද්ධ කරන්නෝ සහ සෝදන්නෝ.

***විදුලි ඉංජිනේරු***

*වයර්මන්වරු, විදුලිරංජකයෝ*

ගුවන්විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු :
එකලස්කරන්නෝ, බැටරිකේස් සාදන්නෝ (ගුවන්විදුලි), පාස්සන්නෝ, සවිකරන්නෝ, සීල් තබන්නෝ, කැබිනට් පිරිසිදු කරන්නෝ, කටර්ස් (වැසි) නමන්නෝ, පින්තාරු කරන්නන්, (බෝඩ්), ඩයල්ස් බැප් යනාදිය පරීක්ෂකයන්, පවර්ප්‍රෙස් ඔපරේටර්වරු, අසුරන්නන්, අනෝඩයිසර්වරු, සෙට්ටෙස්වරු, එවර්වරු, බැෆ්න් මැෂින් ඔපරේටර්වරු, සැන්ඩින් මැෂින් ඔපරේටර්වරු.

***පුහුණු කම්කරුවෝ***

*සිවිල් ඉංජිනේරු :*
ඊයම් වැඩකාරයෝ, කම්හල්කාරයෝ, සළකුණු අඳින්නෝ, පොලිෂ් කරන්නෝ (ප්‍රංශ පොලිෂ් ගාන්නෝ), පෙදරේරුවෝ, තෙල් හා වාෂ්ප රෝල් පදවන්නෝ, ෂිප්රයිටර්වරු, බෝඩ් සාදන්නෝ, හුඩ් සාදන්නෝ, පතල්කරුවෝ, පුපුරවන්නෝ, විදුම්කරුවෝ, කුළුගෙඩිකරුවෝ.

*යාන්ත්‍රික ඉංජිනේරු :*
පට්ටල්කාරයෝ, යන්ත්‍ර ශිල්පීහු (යකඩ හා වානේ වැඩ) යන්ත්‍ර ශිල්පීහු (ලීබඩු) තඹ වැඩකාරයෝ, වැද්දුම්කාරයෝ, බොයිලේරු තනන්නෝ, වැල්ඩිංකාරයින් හා දවන්නෝ, විදුලි මිටි ක්‍රියාකරවන්නෝ, ලිස්තරකාරයෝ (යකඩ හා පිත්තල), පුරුද්දන්නෝ, තවුකාරයෝ, මෝස්තර හදන්නෝ, වඩුවෝ, කැබිනට් සාදන්නෝ, බෝට්ටු සාදන්නෝ, කියත්මුවහත් තියන්නෝ, මැෂින් පිහි මුවහත් තියන්නෝ, ලාන්ච් තංඩෙල්ලා ඩ්‍රයිවරුවරු, පාහන්නෝ, ලනු හා රැවල් හදන්නෝ, වීදුරු සවිකරන්නෝ, ඩරයිවර්වරු, මිකැනික්වරු, බෙලෙක් වැඩ කාරයෝ (මෝටර්), ටින්ස්මිත්ලා, රිවේට්කාරයෝ සහ කෝර්කාරයෝ, දොඹකර ක්‍රියාකරවන්නෝ.

*විදුලි ඉංජිනේරු :*
කාර්මිකයෝ (ගුවන්විදුලි), ට්‍රාන්ස්පෝමර් සාදන්නෝ, කොයිල්ඔතන්නෝ, ඩයිකාස්ටර්ස්, රේඩියෝ මිකැනික්වරු, පොලිෂ්කරන්නෝ (රේඩියෝ කැබිනට් සහ අනෙක් කොටස්), ට්‍රාන්ස්පෝමර් වයින්ඩර්ස් සහ එකලස් කරන්නෝ, ටියුනර් එලයින්නර්වරු.

***කාවල්කාරයෝ***

| | |
|---|---|
| සිවිල් ඉංජිනේරු<br>යාන්ත්‍රික ඉංජිනේරු<br>විදුලි ඉංජිනේරු<br>ගුවන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු | සියළුම ශ්‍රේණිවල යෙදී සිටින කාවල්කාරයෝ |

වෘත්තිය හදාරන්නෝ සහ ආධුනිකයෝ

| | |
|---|---|
| සිවිල් ඉංජිනේරු<br>යාන්ත්‍රික ඉංජිනේරු<br>විදුලි ඉංජිනේරු<br>ගුවන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු | පුහුණු හා අර්ධ පුහුණු සඳහා පුහුණු වීමේ කාල සීමාව අවු : 04කි. |

මෙම උපලේඛනයේ සඳහන් "අවුරුද්ද" යන වචනයෙන් කවර නම් හෝ වෘත්තිය හදාරන්නකු හෝ ආධුනිකයකු සම්බන්ධයෙන් අදහස් වෙන්නේ දවස් 365 ක් අවිච්ජින්නව ස්වාකාර්යයෙහි ඔහු යෙදී සිටි බවයි. එමෙන්ම, පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක න්‍යායික පුහුණුවෙන් පසුව ඇති ප්‍රායෝගික පුහුණුව සඳහා යොදවන්නන් මෙයින් අදහස් කෙරේ.

*II කොටස*

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වර්ෂය | නුපුහුණු<br>රු. ශත | අර්ධ පුහුණු<br>රු. ශත | පුහුණු<br>රු. ශත | මුර කාවල්කරුවන්<br>රු. ශත | වෘත්තීය හදාරන්නන් හා ආධුනිකයින්<br>රු. ශත |
|---|---|---|---|---|---|
| 1 වසර | 12,500.00 | 12,800.00 | 13,100.00 | 12,500.00 | 7,500.00 |
| 2 වසර | 12,600.00 | 12,925.00 | 13,250.00 | 12,600.00 | 7,650.00 |
| 3 වසර | 12,700.00 | 13,050.00 | 13,400.00 | 12,700.00 | 7,800.00 |
| 4 වසර | 12,800.00 | 13,175.00 | 13,550.00 | 12,800.00 | 7,950.00 |
| 5 වසර | 12,900.00 | 13,300.00 | 13,700.00 | 12,900.00 | |
| 6 වසර | 13,000.00 | 13,425.00 | 13,850.00 | 13,000.00 | |
| 7 වසර | 13,100.00 | 13,550.00 | 14,000.00 | 13,100.00 | |
| 8 වසර | 13,200.00 | 13,675.00 | 14,150.00 | 13,200.00 | |
| 9 වසර | 13,300.00 | 13,800.00 | 14,300.00 | 13,300.00 | |
| 10 වසර | 13,400.00 | 13,925.00 | 14,450.00 | 13,400.00 | |
| 11 වසර | 13,500.00 | 14,050.00 | 14,600.00 | 13,500.00 | |
| 12 වසර | 13,600.00 | 14,175.00 | 14,750.00 | 13,600.00 | |
| 13 වසර | 13,700.00 | 14,300.00 | 14,900.00 | 13,700.00 | |
| 14 වසර | 13,800.00 | 14,425.00 | 15,050.00 | 13,800.00 | |
| 15 වසර | 13,900.00 | 14,550.00 | 15,200.00 | 13,900.00 | |
| 16 වසර | 14,000.00 | 14,675.00 | 15,350.00 | 14,000.00 | |
| 17 වසර | 14,100.00 | 14,800.00 | 15,500.00 | 14,100.00 | |
| 18 වසර | 14,200.00 | 14,925.00 | 15,650.00 | 14,200.00 | |

*IV කොටස*

**සතියේ නිවාඩු දිනය (24 වගන්තිය)**

මෙම කොටසේ 2(ආ) වගන්තියෙන් පසුව පහත සඳහන් ඡේදය ඇතුළත් විය යුතු වන්නේ ය.

"එවැනි සති නිවාඩු දිනක පඩිපාලක සභා ආඥාපනතේ 25 වගන්තියේ සඳහන් ප්‍රතිපාදන පරිදි නියම කරනු ලැබූ ප්‍රසිද්ධ නිවාඩු දිනයක් යෙදුනහොත් එම ප්‍රසිද්ධ නිවාඩු දිනය නියමිත දිනට ලබා දී අහිමි වන සති නිවාඩු දිනය වෙනුවට වෙනත් දිනයක් ඊළඟ සති නිවාඩුව එළඹීමට ප්‍රථම දවස් 06 ඇතුළත ලබා දිය යුතු වේ."

11-983/1

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩි පාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2012 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
සභාපති,<br>
රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 10 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1971 ක් වූ අප්‍රේල් මස 29 වැනි දින අංක 14955/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරන ලද්දා වූද, අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස් ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

*II කොටස*

***සේවක පන්තිය***

*I වැනි ශ්‍රේණිය (පුහුණු)*

මෝස්තරකරුවෝ, කැටයම්කරුවෝ, රටා පිළිබඳ ජොබර්වරු, (වියන අංශය) ඉදිරිපස සයිසිං යන්ත්‍රකරුවෝ, වැද්දුම්කරුවෝ, කාඩිං අංශය, වේගප්‍රේම් අංශය, නූල් කටින අංශය, වයින්ඩිං අංශය, වෝපිං අංශය, සයිසිං අංශය, වියන අංශය.

*ප්‍රධාන ජොබර්වරු :*

වේගප්‍රේම් අංශය, නූල් කටින අංශය, වියන අංශය.

*ජොබර්වරු :*

නිමැවුම් අංශය, සයිසිං අංශය, කොම්බිං අංශය, කාඩ් අංශය.

*පේලි ජොබර්වරු :*

***වියන අංශය***

*II වැනි ශ්‍රේණිය (පුහුණු)*

*නූල් කඳන් ගැටගසන්නෝ, ජොබර්වරු :*

ගුදම් අංශය, මුද්‍රණ අංශය, සායම් අංශය, බ්ලිචිං අංශය, ඩබ්ලිං අංශය, වයින්ඩිං අංශය, වෝපිං අංශය, ඩ්‍රොයිං අංශය, මික්සිං සහ බ්ලෝරූම් අංශය,

*ජොබර් සහායකවරු :*

*කාඩිං අංශය*

*ජේලි ජොබර්වරු :*

නූල් කැටීමේ අංශය, වේගප්‍රේම් අංශය, හිරවූ වියමන සකසන්නෝ, වියන්නෝ,

*අඩ පුහුණු*

බේල් කරන්නෝ (මිටි බැඳීම හා බේල් කිරීම) බැන්ඩර්වරු, මිටි බඳින්නෝ, කැලැන්ඩර් යන්ත්‍ර කරුවෝ, වඩු කාර්මිකයෝ, රසායන කරුවෝ, ශීතකරන යන්ත්‍ර කරුවෝ, ගණන් කරන්නෝ.

*නූල් අංශය - කටර්ස් :*

රෝලර්වරු, ක්‍රීල් බොයිස් (වෝපිං අංශය) කපන්නෝ

*කාඩ් අංශය :*

කැපුම් බලන්නෝ/ප්‍රධාන කැපුම් බලන්නෝ, ඩෝෆර්වරු, ඩබ්ලර්වරු, නූල් අඳින්නෝ, සරසන්නෝ.

*නූල් අංශය :*

වියලන යන්ත්‍රකරුවෝ, සායම් පොවන්නෝ, විස් සහ බිම් අංශය.

*මිම් තබන්නෝ :*

ස්පින්ඩිල් අංශය, සෝදිසි කරන්නෝ, ප්‍රථම වියමන් වැද්දුම්කරුවෝ, සහායක මුවහත් කරන්නෝ, කාඩ්ප්ලැට් අංශය, හයිඩ්‍රෝ, එක්ස්ට්‍රැක්ටර් ක්‍රියාකරුවෝ.

*ජොබර්වරු, ඩොපිං අංශය :*

ජිගර් යන්ත්‍රකරුවෝ, කංකානම්වරු, ක්යර් යන්ත්‍රකරුවෝ, මැෂින් අටෙන්ඩර්වරු, ටබ්ලර් බැන්ඩිං අංශය.

*යන්ත්‍රකරුවෝ :*

එන්ජිං අංශය, කොම්බිං අංශය, ක්‍රොපිං සහ ෂියරිං අංශය, පැඩිං අංශය, මුද්‍රණ අංශය, රිබන් ලැප් අංශය, සිල්වර් ලැප් අංශය, සෝපිං අංශය.

*යන්ත්‍ර සේවිකාවෝ :*

ඇඳඇතිරිලි

*මර්ස්ර්රයිසර් යන්ත්‍රකරුවෝ, සංයෝජකයෝ :*

වර්ණය, ප්‍රමාණය,

*නූල් අමුණන්නෝ, රිල්වරු, අලුත්වැඩියා කරන්නෝ :*

කෝම්බිං ඉඳිකටු, ප්ලේන්ජ දැල් සහ පනා, ස්පින්ඩල්, ඉත්තන්ගේ කුරු, සැම්පල්කරුවෝ, සැන්ෆෝරයිසර් යන්ත්‍රකරුවෝ, ස්ක්‍රීන් පිළියෙල කරන්නෝ, ස්ක්‍රීන් මුද්‍රණ කරුවෝ, පිළියෙල කරන්නෝ.

*කාඩ් අංශය :*

මහන්නෝ, සින්ජින් සහ ඩිසයින් යන්ත්‍ර ක්‍රියාකරුවෝ/සයිසිං යන්ත්‍ර ක්‍රියාකරුවෝ - පිටුපස

*පනාකඳ සකසන්නෝ, ස්පිනර්ස් :*

මියුල්රිං, ස්ටෙන්ටර් යන්ත්‍රකරුවෝ, මහන්නෝ, ටේප් ටෙන්ඩර්වරු, කාඩ් ඩොයිං, ඉන්ටර් රීඩිං, සිම්ලෙක්ස්, ස්ලබිං, වෙස්ට් කාඩ්.

*බක්කිකරුවෝ :*

නූල් කැරලි සුදු කිරීම, නූල් කැරලි සායම් කිරීම, කපු නූල් සායම් කිරීම.

*වයින්ඩර්වරු :*

ස්වයංක්‍රීය පර්න්ග්‍රේ, චීස් කෝන්, ඩබ්ලර්, යුනිවර්සල් පර්න්, එතුම්කරුවෝ (නූල් කටින අංශය)

*__නුපුහුණු__*

බැක්පලර් යන්ත්‍රකරුවෝ, බේල්කරන්නෝ (ගුදම්), බේල් ලකුණු කරන්නෝ, බේල් කිරීම පරීක්ෂා කරන්නෝ, බැටරි පුරවන්නෝ, ගෙනයන්නෝ, බින්, බොබිං, කපුපිළි, ඩොප්, ලැප්, සටහන් පුවරු.

*සුද්ධ කරන්නෝ :*

ලූම් යන්ත්‍ර, ඉපියන්, බැම් රෙදි ගොඩ ගසන්නෝ, ක්‍රීල් බොයිස් (බුමුතුරුණු අංශය), බැම් කපන්නෝ, ඉවත යන පුලුන් එකතු කරන්නෝ,

*නැවුම්කරුවෝ :*

ග්‍රීස්, අත්

*උදව්කරුවෝ, කම්කරුවෝ, යන්ත්‍රකරුවෝ :*

ජිගින්, විලෝ, බ්‍රලෙන්ඩිං සේදීම,
අංක සලකුණු කරන්නෝ/සේවකයෝ, තෙල් දමන්නෝ, අසුරන්නෝ.

*රොඩු අහුලන්නෝ, ප්ලේටර්වරු :*

ඉදිරිපස / පසුපස,
සහකාර රෝලර් ආවරණකරුවෝ, රෝවිං වේස්ට් ඔපන්වරු, සීඩ් එකතුකරන්නෝ සහ අසුරන්නෝ, ස්කෙවර්ස් අලුත්වැඩියා කරන්නෝ, සේල්මේකර්

*සහායකවරු, (මුද්‍රා තබා මිටි බඳින්නෝ) :*

මසන්නෝ - මලු - පටි, ස්ටයිපර්වරු, ස්කචර්වරු, අමදින්නෝ, නූල් අහුලන්නෝ, නූල් කිරුම්කරුවෝ/ස්කේල්මන්වරු - ෆර්න්වයින්ඩර්වරු (බුමුතුරුණු අංශය) නූල් සමනය කරන්නෝ සහ බෙදා හරින්නෝ.

මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| සේවා වර්ෂය | නුපුහුණු<br>රු. ශත | අර්ධ පුහුණු<br>රු. ශත | පුහුණු II<br>රු. ශත | පුහුණු I<br>රු. ශත |
|---|---|---|---|---|
| 1 වැනි වසර | 9,660.00 | 10,080.00 | 10,500.00 | 10,920.00 |
| 2 වැනි වසර | 9,760.00 | 10,205.00 | 10,650.00 | 11,095.00 |
| 3 වැනි වසර | 9,860.00 | 10,330.00 | 10,800.00 | 11,270.00 |
| 4 වැනි වසර | 9,960.00 | 10,455.00 | 10,950.00 | 11,445.00 |
| 5 වැනි වසර | 10,060.00 | 10,580.00 | 11,100.00 | 11,620.00 |
| 6 වැනි වසර | 10,160.00 | 10,705.00 | 11,250.00 | 11,795.00 |
| 7 වැනි වසර | 10,260.00 | 10,830.00 | 11,400.00 | 11,970.00 |
| 8 වැනි වසර | 10,360.00 | 10,955.00 | 11,550.00 | 12,145.00 |
| 9 වැනි වසර | 10,460.00 | 11,080.00 | 11,700.00 | 12,320.00 |
| 10 වැනි වසර | 10,560.00 | 11,205.00 | 11,850.00 | 12,495.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මෝටර් රථ ගමනා ගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට මෝටර්රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩි පාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වන විරෝධතාවයන් 2012 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
සභාපති,<br>
මෝටර් රථ ගමනා ගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 05 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1947 ක් වූ පෙබරවාරි මස 14 වැනි දින අංක 9667 දරන *ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරන ලද්දා වූද, සහ අවසන්වරට 2010 ජූනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ වෙනස් කරන ලද්දා වූ තීරණ පහත දැක්වෙන පරිදි තවදුරටත් එම උපලේඛනයෙහි II වැනි කොටසේ 6 වන ඡේදය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

**අවම මාසික වේතන**

***කම්කරුවාගේ පන්තිය***

*ඒ පන්තියේ කම්කරුවෝ*

මගීන් 22 කට වැඩියෙන් ගෙන යාමට අවසර ලත් බස්රථ රියැදුරෝ.

*බී පන්තියේ කම්කරුවෝ*

මගීන් 22ක් හෝ ඊට අඩු ගණනක් ගෙන යාමට අවසරලත් බස්රථ රියැදුරෝ, ගිලන් රථ රියැදුරෝ හා හොණ්ඩර 20කට වඩා වැඩි බර ගෙන යාමට අවසර ලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන්රථ රියැදුරෝ.

*සී පන්තියේ කම්කරුවෝ*

කුලී කාර් සහ කැබ් රථ රියැදුරෝ, හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන්රථ රියැදුරන්, ත්‍රීරෝද රථ රියැදුරන් හා මිනී රථ රියැදුරන්.

*ඩී පන්තියේ කම්කරුවෝ*

ප්‍රවාහන කාර්යයන් සඳහා යොදවනු ලබන ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් රථ පදවන රියැදුරෝ හෝ ට්‍රේලර් සහිත ලොරි පදවන රියැදුරෝ (ස්කැමල් හෝස් වර්ගයේ ඒවා ඇතුළුව - එහෙත් වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ටේලර් සහිත ලොරි, ටේලර් සහිත ලොරි හැර).

*ඊ පන්තියේ කම්කරුවෝ*

වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනා ගමනයෙහි පමණක් යොදවන්නාවූ පහත සඳහන් වන රථවල රියැදුරෝ : එනම්, (අ)

ලොරි සහ (ආ) ට්රේලර් සහිත ට්‍රැක්ටර් රථ.

*එෆ් පන්තියේ කම්කරුවෝ*

බස් රථවල නියුක්ත කොන්දොස්තරවරු, ලිපිකරුවෝ, කැෂියර්වරු, ප්‍රවේශපත්‍ර ලිපිකරුවෝ, ආසන වෙන් කරන ලිපිකරුවෝ.

*ජී පන්තියේ කම්කරුවෝ*

හොණ්ඩර 20 කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරිවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

*එච් පන්තියේ කම්කරුවෝ*

හොණ්ඩර 20 ක් හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරිවල සහ බස්රථ, කුලී කාර්, කැබ් රථ, වැන් රථ, ගිලන් රථ හා මිනී රථවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

*අයි පන්තියේ කම්කරුවෝ*

බස්රථ චෙකර්වරු හෝ වේලාව තබන්නෝ.

*ජේ පන්තියේ කම්කරුවෝ*

බස් රථ පරීක්ෂකවරු සහ නැවතුම්පලවල පරිපාලකවරු.

*කේ පන්තියේ කම්කරුවෝ*

මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි යෙදී සිටින එහෙත්, මෙහි ඉහත කොටස්වල සඳහන් නොවූ කම්කරුවෝ.

ඉහත සඳහන් තීරණවල :

(අ) "ක්ලීනර්වරු" යන්නෙන් ලොරි, බස් රථ, කුලී කාර්, කැබ් රථ, වැන් රථ, ගිලන් රථ හෝ මිනී රථ යන මේවායෙහි යන්ත්‍රෝපකරණ මනාව තබා ගැනීමේ යොදවා සිටින (ලියකියවිලි වැඩෙහි නිරත සේවකයන් නොවන) කම්කරුවන් අදහස් කරනු ලැබේ.

(ආ) "පෝටර්වරු" යන්නෙන් ලොරි, බස් රථ, කුලී කාර්, කැබ් රථ, වැන් රථ, ගිලන් රථ හෝ මිනී රථ යන මේවාට බඩු පැටවීමෙහි හෝ ඒවායේ බඩු බෑමෙහි යොදවා සිටින හා ඔවුන්ගේ වැඩ සම්බන්ධයෙන් ඒ රථ වලම ගමන් කිරීමට අවශ්‍ය කම්කරුවන් අදහස් කරනු ලැබේ.

## *II වැනි කොටස*

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *ආයතනයේ සේවා වර්ෂය* | *ඒ පන්තිය ඩී පන්තිය* | *බී පන්තිය* | *සී පන්තිය* | *ඊ, එෆ්, ජේ පන්තිය* | *ජී පන්තිය අයි පන්තිය* | *එච් පන්තිය* | *කේ පන්තිය* |
|---|---|---|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1 වන වසර | 10,650.00 | 10,275.00 | 9,865.00 | 9,565.00 | 9,225.00 | 8,965.00 | 8,625.00 |
| 2 වන වසර | 10,850.00 | 10,450.00 | 10,015.00 | 9,690.00 | 9,325.00 | 9,065.00 | 8,725.00 |
| 3 වන වසර | 11,050.00 | 10,625.00 | 10,165.00 | 9,815.00 | 9,425.00 | 9,165.00 | 8,825.00 |
| 4 වන වසර | 11,250.00 | 10,800.00 | 10,315.00 | 9,940.00 | 9,525.00 | 9,265.00 | 8,925.00 |
| 5 වන වසර | 11,450.00 | 10,975.00 | 10,465.00 | 10,065.00 | 9,625.00 | 9,365.00 | 9,025.00 |
| 6 වන වසර | 11,650.00 | 11,150.00 | 10,615.00 | 10,190.00 | 9,725.00 | 9,465.00 | 9,125.00 |
| 7 වන වසර | 11,850.00 | 11,325.00 | 10,765.00 | 10,315.00 | 9,825.00 | 9,565.00 | 9,225.00 |
| 8 වන වසර | 12,050.00 | 11,500.00 | 10,915.00 | 10,440.00 | 9,925.00 | 9,665.00 | 9,325.00 |
| 9 වන වසර | 12,250.00 | 11,675.00 | 11,065.00 | 10,565.00 | 10,025.00 | 9,765.00 | 9,425.00 |
| 10 වන වසර | 12,450.00 | 11,850.00 | 11,215.00 | 10,690.00 | 10,125.00 | 9,865.00 | 9,525.00 |
| 11 වන වසර | 12,650.00 | 12,025.00 | 11,365.00 | 10,815.00 | 10,225.00 | 9,965.00 | 9,625.00 |
| 12 වන වසර | 12,850.00 | 12,200.00 | 11,515.00 | 10,940.00 | 10,325.00 | 10,065.00 | 9,725.00 |
| 13 වන වසර | 13,050.00 | 12,375.00 | 11,665.00 | 11,065.00 | 10,425.00 | 10,165.00 | 9,825.00 |
| 14 වන වසර | 13,250.00 | 12,550.00 | 11,815.00 | 11,190.00 | 10,525.00 | 10,265.00 | 9,925.00 |
| 15 වන වසර | 13,450.00 | 12,725.00 | 11,965.00 | 11,315.00 | 10,625.00 | 10,365.00 | 10,025.00 |

11 - 983/3

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සාත්තු නිවාස ව්‍යාපාර කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි ඇති පරිද්දෙන් වෙනස් කිරීමට සාත්තු නිවාස ව්‍යාපාර කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩි පාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2012 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
සාත්තු නිවාස ව්‍යාපාර කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

සාත්තු නිවාස ව්‍යාපාරය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1974 ක් වූ මාර්තු මස 22 වැනි දින අංක 104 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කලට වෙනස් කරන ලද්දා වූද, අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

***කම්කරුවාගේ පන්තිය***

*I වැනි ශ්‍රේණිය*

මේට්‍රන්වරියන්, ඇපොතිකරිවරුන්.

*II වැනි ශ්‍රේණිය*

ඖෂධවේදීන්, සාත්තුකාර සහෝදරියන්, රසායනාගාර ශිල්පීන්, එක්ස්රේ කාර්මිකයන්.

*III වැනි ශ්‍රේණිය*

(අ) සාත්තු සේවිකාවන්, වින්නඹුවන්, ගබඩා භාරකරුවන්
(ආ) පුහුණුව ලබන සාත්තු සේවිකාවන්

1 වැනි වසරේ පුහුණුව සඳහා
2 වැනි වසරේ පුහුණුව සඳහා
3 වැනි වසරේ පුහුණුව සඳහා

*IV වැනි ශ්‍රේණිය*

ලිපිකරුවන්, යතුරු ලේඛකයින්, අමුත්තන් පිළිගන්නන්, දුරකථන ක්‍රියාකරුවන්, අයකැමියන්

*V වැනි ශ්‍රේණිය*

උපස්ථායකයින්, ඩිස්පෙන්සර්වරුන්, ශල්‍ය ඩ්‍රෙසර් වරුන්, ස්ටුවර්ඩ් වරුන්, ඕවර්සියර්වරුන්, වාට්ටු ලිපිකරුවන්, කෑම වට්ටෝරු ලිපිකරුවන්.

*VI වැනි ශ්‍රේණිය*

ඕඩර්ලිවරුන්, පියන්වරුන්, අරක්කැමියන්, මුරකරුවන්, කසළ ශෝධක කම්කරුවන්.

*VII වැනි ශ්‍රේණිය*

ලිනන් කාමරවල උපස්ථායකයින්, කම්කරුවන්, උද්‍යාන කම්කරුවන්, අමදින්නන්, පැන්ට්රි බෝයිස්

පුහුණුව ලබන සාත්තු සේවිකාවන් සම්බන්ධයෙන් "වසර" යන්නෙන් අදහස් කරනුයේ "දොලොස් මසක සේවා කාලයකි".

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| සේවා වර්ෂය | *I වැනි ශ්‍රේණිය* | *II වැනි ශ්‍රේණිය* | *III වැනි ශ්‍රේණිය (ඒ)* | *III වැනි ශ්‍රේණිය (බී)* | *IV වැනි ශ්‍රේණිය* | *V වැනි ශ්‍රේණිය* | *VI වැනි ශ්‍රේණිය* | *VII වැනි ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1 වන වර්ෂය | 11,175.00 | 10,935.00 | 10,530.00 | 6,620.00 | 10,205.00 | 9,880.00 | 9,560.00 | 9,315.00 |
| 2 වන වර්ෂය | 11,425.00 | 11,160.00 | 10,730.00 | 6,770.00 | 10,380.00 | 10,030.00 | 9,685.00 | 9,415.00 |
| 3 වන වර්ෂය | 11,675.00 | 11,385.00 | 10,930.00 | 6,920.00 | 10,555.00 | 10,180.00 | 9,810.00 | 9,515.00 |
| 4 වන වර්ෂය | 11,925.00 | 11,610.00 | 11,130.00 | | 10,730.00 | 10,330.00 | 9,935.00 | 9,615.00 |
| 5 වන වර්ෂය | 12,175.00 | 11,835.00 | 11,330.00 | | 10,905.00 | 10,480.00 | 10,060.00 | 9,715.00 |
| 6 වන වර්ෂය | 12,425.00 | 12,060.00 | 11,530.00 | | 11,080.00 | 10,630.00 | 10,185.00 | 9,815.00 |
| 7 වන වර්ෂය | 12,675.00 | 12,285.00 | 11,730.00 | | 11,255.00 | 10,780.00 | 10,310.00 | 9,915.00 |
| 8 වන වර්ෂය | 12,925.00 | 12,510.00 | 11,930.00 | | 11,430.00 | 10,930.00 | 10,435.00 | 10,015.00 |
| 9 වන වර්ෂය | 13,175.00 | 12,735.00 | 12,130.00 | | 11,605.00 | 11,080.00 | 10,560.00 | 10,115.00 |
| 10 වන වර්ෂය | 13,425.00 | 12,960.00 | 12,330.00 | | 11,780.00 | 11,230.00 | 10,685.00 | 10,215.00 |

11 - 983/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.